විද්‍යාලය : ර/ ඇරැපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දුර

නිර්දේශිත ග්‍රන්ථය : පුරාතන ගද්‍ය සංග්‍රහය (**සද්ධර්මාලංකාරය**)
කතා පුවත : **නන්දි වාණිජ වස්තුව**

**පහත සඳහන් ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

**02.** "එ බසට කැටි ව යන සේවකයෝ කියන්නාහු "මේ පටුන්ගම බොහෝ සම්පත්තීන් සමෘද්ධ වූ නනදිය නම් වෙළෙඳාණ කෙනෙක් ඇත; දූන් තෙල රත්පියුමෙක රත්පියුම් කෙමියක් වටා ලීලෝපේත ව පෙළ සැදී සිටගත්තා වූ රත් සුදු වෛවර්ණ මුසු කේශර පඞක්තියක් හා සමාන අතරතුර රත්පැහැ මුසු කොඳ කැකුළු පෙළක් වැනි සුදු සිනිඳු වූ දන්තරශ්මීන් විහිදුවා මඳ මඳ සිනා සිසී නිලුපුලපෙති පරයන නිල්නෙතින් මේ දසාව බලා සිටි රූප සම්පන්න වූ අවබාල ගෑනුබාලයෝ නම් ඒ වෙළෙඳාණන්ගේ භාර්‍ය්‍යාවෝ යැ" යි කීහ."

01) පටුන්ගම බොහෝ සම්පත්තීන් සමෘද්ධ වෙළෙන්දා කවුද?

02) මෙම වර්ණනාව කර ඇත්තේ කවුරුන් ගැන ද?

03) ඇගේ දත් උපමා කර ඇත්තේ මොනවාටද?

04) නිලුපුලපෙති පරදින්නේ මොනවාට ද?

05) මෙම ඡේදයෙහි සඳහන් උපමා දෙකක් උපුටා දක්වන්න.

**පහත පදවලට කෙටි විවරණ සපයන්න.**

01) රත්පියුමෙක -
02) පියුම් කෙමියක් -
03) ලීලෝපේත ව -
04) වෛවර්ණ -
05) කේශර පඞක්තියක් -
06) කොඳ කැකුළු -
07) නිලුපුලපෙති -
08) පරයන -
09) අවබාල -
10) ගෑනුබාලයෝ -

**පහත සඳහන් උද්ධෘත ලිහිල් බසින් ලියන්න.**

1) "දූන් තෙල රත්පියුමෙක රත්පියුම් කෙමියක් වටා ලීලෝපේත ව පෙළ සැදී සිටගත්තා වූ...."

02) " රත් සුදු වෛවර්ණ මුසු කේශර පඞක්තියක් හා සමාන...."

03) " කොඳ කැකුළු පෙළක් වැනි සුදු සිනිඳු වූ දන්තරශ්මීන් විහිදුවා මඳ මඳ සිනා සිසී ...."

04) " රූප සම්පන්න වූ අවබාල ගෑනුබාලයෝ නම් ඒ වෙළෙඳාණන්ගේ භාර්‍ය්‍යාවෝ යැ"

**විචාර ප්‍රශ්නය** ඃ - "සද්ධර්මාලංකාරය" පොදු ජනයා කුසල ක්‍රියාවන්හි නියැලැවීමේ අරමුණින් රචිත ග්‍රන්ථයකි." නියමිත කතා වස්තු ඇසුරින් මෙම කියමන පහදන්න.